## ඖෂධ ගබඩා කිරීමේදී

- ශීතකරණයේ තැබීමේදී ඖෂධ වෙනම ලේබල් කර තබන්න.
- දියරමය ඖෂධ අඩංගු බෝතලයක් නම් ලේබලය තෙත් වීමෙන් වළක්වන්න. (බොඳ වූ විට කියවීම අපහසු නිසා)



### ඖෂධ විෂ වීම් වළකමු

- ගබඩා කිරීමේදී කුඩා දරුවන්ගෙන් ඈත් කර තබමු.
- වෛද්‍ය උපදෙස් වලට අනුව පමණක් ඖෂධ ලබා ගනිමු.
- විෂ වීමකදී රෝගියා ළඟම ඇති රෝහල කරා රැගෙන යමු.


**011-2686143**
**011-2691111** දිගුව **2430**

Email : npdic.nhs@gmail.com
infotoxlanka@gmail.com

https://www.facebook.com/ NTPICSL

http://www.toxbaselanka.info



අනුග්‍රහය
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය


# ඖෂධ විෂවීම් වළකමු




ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

ඕනෑම ඖෂධයක්

- වැඩි වාර ගණනක් ගැනීමෙන්
- නියම කරන ලද ප්‍රමාණය ඉක්මවා ගැනීමෙන්

ඖෂධ විෂවීම් සිදුවිය හැක.

## ඖෂධ විෂවීම් නිසා බහුලව රෝහල් ගත වනුයේ,

- කුඩා ළමුන්
- වයෝවෘද්ධ පුද්ගලයින්
- මානසික රෝගවලින් පෙළෙන්නන්
- කල් පවතින රෝග හා සුව නොවන රෝග වලින් පීඩා විඳින රෝගීන්

## ඖෂධ විෂවීම් බහුල වීමට හේතු

- කුඩා ළමුන්ට පහසුවෙන් ගතහැකි වන සේ ඖෂධ ගබඩා කිරීම.
- වයෝවෘද්ධ පුද්ගලයින් අතපසු වීමෙන් වැරදි මාත්‍රාවක් ගැනීම.
- මානසික රෝගීන් හා සුව නොවන රෝගවලින් පීඩා විඳින රෝගීන් සිතාමතා අධි මාත්‍රා ගැනීම.
- වෛද්‍ය උපදෙස් නොතකා තම අභිමතය පරිදි ඖෂධ ගැනීම.



## ඖෂධ විෂවීම් අවම කර ගැනීමට

- ළමයින්ට පහසුවෙන් හසු නොවන සේ සුරක්ෂිතව ගබඩා කිරීම.
- වයෝවෘද්ධ හා මානසික ව්‍යාකූල සහිත අය සඳහා තවත් කෙනෙකුගේ උපකාර ඇතිව ඖෂධ ලබා දීම.
  මේ සඳහා කාලනීර්ණ ඖෂධ අසුරනයක් ( Dosett Box) භාවිතා කිරීම.




- වෛද්‍ය උපදෙස්වලට අනුව නියමිත මාත්‍රා ගණනට හා දින ගණනට පමණක් ඖෂධ ලබා ගැනීම.



## විෂ වීමකදී

- රෝගියාගේ බිය තුරන් කරන්න.
- පානය කිරීමට කිසිවක් නොදෙන්න.
- වමනය කරවීමෙන් වළකින්න.
- රෝගියා වමනය කරයිනම් පහත රූපයේ පරිදි වම් ඇළයට හරවා නිකට මදක් ඔසවා තබන්න.



- ඖෂධ බහා ලූ ඇසුරුම ඇති නම් එයද සමඟ රෝගියා ළඟම පිහිටි රෝහල කරා රැගෙන යන්න.
- අවශ්‍ය නම් 1990 අමතා හදිසි ගිලන් රථ සේවාව ලබා ගන්න.

## රෝගියාට ප්‍රතිකාර කිරීමේදී පහත කරුණු වැදගත්වේ

- ලබාගත් ඖෂධය කුමක්ද යන වග
- ශරීර ගත වී ඇති ඖෂධ ප්‍රමාණය
- ඖෂධ ලබා ගත් වේලාව